# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE


මගේ අංකය / எனது இல / My No: DSD/HO/09/CBO/ | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2017/07/04

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය

**<u>සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීම හා ලියාපදිංචි කිරීම</u>**

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීම හා ලියාපදිංචි කිරීම සම්බන්ධ අංක ප්‍රජාමූල/01/2017/01 හා අංක ප්‍රජාමූල/02/2017/02 දරන චක්‍රලේඛ හා බැඳේ.

02. 2013 අංක 01 දරණ සමෘද්ධි පනත, 2017 මාර්තු 07 වැනි දිනැති ගැසට් පත්‍රය හා ඉහත චක්‍රලේඛ මෙන්ම දැනුවත් කිරීමේ වැඩමුළුවේදී ලබාදුන් උපදෙස් අනුව සමෘද්ධි සමිති පදනම් කරගෙන හෝ එම සමෘද්ධි සමිති වල ප්‍රමාණවත් සාමාජික /සාමාජිකාවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක අවම වශයෙන් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශකට එක් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් හෝ පිහිටුවිය හැකි පරිදි පළමු මහ සභා රැස්වීම පවත්වා චක්‍රලේඛ උපදෙස් අනුව සියලුම ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම හා 2017 ජුලි 22 දිනට පෙර ලියාපදිංචි සහතික ලබාදීම අනිවාර්යෙන්ම ඉටුවිය යුතු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් බව අවධාරණය කර සඳහන් කරමි.

03. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන් තුල පිහිටි සියලුම ග්‍රාම නිලධාරි වසම් සඳහා ඉහත පදනමින් ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමෙන් පසුව එම ප්‍රජාමූල සංවිධාන වල සභාපතිවරුන්ගේ එකතුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් චක්‍රලේඛ උපදෙස් අනුව සියලුම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීම හා 2017 ජුලි 22 දිනට පෙර ලියාපදිංචි සහතික එම සංවිධාන වෙත ලබාදීම අනිවාර්යෙන්ම ඉටුවිය ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් බව අවධාරණය කර සඳහන් කරමි.

04. ඉහත 02 පරිදි සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම හා ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ අනිවාර්ය රාජකාරියක් වන අතර, එම රාජකාරිය එම නිලධාරින් විසින් ඉටු නොකරන්නේ නම්, හෝ අදාල වසම පුරප්පාඩුව පවතින්නේ නම්, විධිමත් පරිදි බලය පවරා වැඩ බලන නිලධාරියෙකු මඟින් හෝ වෙනත් සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු මඟින් හෝ කලාප සහකාර ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරි මඟින් හෝ එම රාජකාරිය ඉටු කරවා ගැනීමට අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

05. ඉහත 03 පරිදි සමෘද්ධි ප්‍රාදේශිය සංවිධාන පිහිටුවීම හා ලියාපදිංචිය සඳහා අවශ්‍ය කටයුතු කිරීම මූලස්ථාන සමෘද්ධි කළමනාකරුට අයත් අනිවාර්ය රාජකාරියක් වන අතර, එම රාජකාරිය එම නිලධාරින් විසින් ඉටු නොකරන්නේ නම්, හෝ එම තනතුර පුරප්පාඩුව පවතින්නේ නම්, විධිමත් පරිදි බලය පවරා වැඩබලන නිලධාරියෙකු මඟින් හෝ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සිටින වෙනත් සමෘද්ධි කළමනාකරුවෙකු මඟින් හෝ දිස්ත්‍රික් සමෘද්ධි කළමනාකරුවෙකු මඟින් හෝ එම රාජකාරිය ඉටු කරවා ගැනීමට අවශ්‍යය කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

06. ඉහත 04 හා 05 පරිදි කටයුතු කිරීමට අපහසුතාවයක් ඇත්නම්, අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම පිණිස එසේ පිහිටුවීමට නොහැකිවන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන පිළිබඳ විස්තර, හැකි ඉක්මණින් ප්‍රජාමූල සංවිධාන අංශයට දැනුම් දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි.

පී.ආර්.ඩී.එච්. අනුරවංශ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ප්‍රජාමූල සංවිධාන අංශය,
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் (மனிதவளம்) / Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |


D/mannew/Anuravansha sir ප්‍රජාමූ.සං.හාප්‍රාදේ.සං.පිහිටුවීම ලියාපදිංචිය